අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ -03/2023

මගේ අංක : MOJ/E18/අධි:ආපන-2023
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.
2023.10.10

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපති/අතිරේක මහේස්ත්‍රාත්වරුන්,
රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය,
රෙජිස්ට්‍රාර් අභියාචනාධිකරණය,

## ආපනශාලා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා විධිවිධාන හඳුන්වා දීම

ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි වල සඳහන් විධිවිධානයන් හා රාජ්‍ය වියදම් කළමණාකරණ හා රාජ්‍ය සම්පත් විචක්ෂණශීලීව භාවිතා කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ විධිවිධාන දක්වා ඇති පරිදි, වරින් වර ඊට අදාලව නිකුත් කර ඇති ආනුශාංගික චක්‍රලේඛයන්ටද, අනුගත වෙමින් සුභ සාධක පහසුකම් සැපයීමේ අවශ්‍යතාවය සලකා අධිකරණවල කාර්ය මණ්ඩලය හා සේවා දායකයන් සඳහා සුභ සාධක පහසුකම් සැපයීමේ අරමුණින් අධිකරණ පරිශ්‍රයන්හි ආපනශාලා පවත්වා ගෙන යාම විධිමත්ව හා නිසි අධීක්ෂණයකින් නියාමනය කිරීමේ අවශ්‍යතාවය උද්ගතවී ඇත. එබැවින් අධිකරණ පරිශ්‍රයන්හි ආපනශාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත නියමයන් ප්‍රකාරව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

02. **ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා අවම කුලිය ගණනය කිරිම.**

I. ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරිමට පෙර ආපනශාලාව ආරම්භ කිරිමට යෝජිත ගොඩනැගිල්ලේ කුලිය සඳහා රජයේ තක්සේරුවක් ලබා ගත යුතුවේ.ඒසේ ගණනය කිරිමේදි,

- ආපනශාලාව පවත්වාගෙන යාමට අපේක්ෂිත පරිශ්‍රයේ විදුලිය හා ජලය සඳහා වෙනම මනු යොදා සකස්කර ඇති ආපනශාලා ඇත්නම් එම ගාස්තු සැපයුම්කරු වෙතින් අයකරගත යුතුය.
- විදුලිය සහ ජලය සැපයීම සඳහා වෙනම මනු කියවුම් යොදා සකස්කර නොමැති අවස්ථාවලදී පරිහරණය කරන විදුලිය හා ජලය සඳහා තක්සේරු ගණනක් කුලි මුදලට එකතු කර අයකල යුතුය.
- ආපනශාලාව සඳහා භාවිතා කිරිමට අධිකරණය මඟින් ලබා දි ඇති භාණ්ඩ ඇත්නම් එම භාණ්ඩවල ක්ෂය පිරිවැයද කුලී මුදලට ඇතුලත් කල යුතුය.

II. ඒ අනුව ඉහත පරිදි ගණනය කළ අවම කුලිය හෝ ඊට වැඩි මුදලකට ආපන ශාලාව සඳහා සැපයුම්කරුවෙකු තෝරාගත යුතු වේ.

03. **සුදුසු සැපයුම්කරුවකු තෝරා ගැනිම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරිම.**

I. ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ මාර්ගෝපදේශ වලට අනුකූලව ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා සුදුසු ආපනශාලා හිමියෙක් / ආයතනයක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.

II. එම සැපයුම්කරුට ආපනශාලා පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි සහතිකයක් ( Business Registration) සහිත ආයතනයක් විය යුතුය.

III. තෝරාගත් සැපයුම්කරුගෙන් මාස 03ක කුලී ආදායම එක්වර අයකර ගතයුතු අතර එම තැන්පතුව නිදහස් කරනු ලැබිය යුත්තේ ගිවිසුම් කාලය අවසන් වූ පසුවය. ආපනශාලාව පවත්වාගෙන යාමේදී රජයේ වත්කම්වලට හානියක් සිදුවී ඇත්නම් එම හානිය එම තැන්පතු මුදලින් අයකරවා ගත යුතුය.

IV. තේරීපත්වන ලංසුකරු හට කිසිදු අවස්ථාවක ආපනශාලාව උප බදු ලබා දීමට අවසර ලබා නොදිය යුතුය.

V. සැපයුම්කරු වාර්ෂිකව තෝරා ගත යුතුය.

04. **සැපයුම්කරු සමඟ සේවා ගිවිසුමකට එළඹීම**

එසේ තෝරා ගන්නා සැපයුම්කරු සමඟ සේවා කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය.

I. ගිවිසුමට එළඹීමේදී සාමාන්‍ය ගිවිසුම් කොන්දෙසි වලට අමතරව පහත කරුණුද ඇතුලත් විය යුතුය.

- ආහාර ද්‍රව්‍ය විකිණීම සඳහා එකඟවූ මිල ගණන් කොන්ත්‍රාත් කාලය පුරාම එක ලෙස ක්‍රියාත්මක විය යුතු අතර යම් මිල ගණන් සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් සැපයුම්කරු විසින් සිදුකරන ලිඛිත ඉල්ලීමක් ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි සංශෝධනය කර ගත හැකි බවට,
- ආපනශාලාවේ අනුමත මිල ගණන් ආපනශාලාව ඉදිරියේ පැහැදිලිව ප්‍රදර්ශනය කරන බවට,
- ආපනශාලාව විවෘත කරන දිනයන් හා ආරම්භ කළ යුතු හා අවසන් කළ යුතු වේලාවන් පිළිබඳව,
- ආපනශාලාවේ එකතුවන අපද්‍රව්‍ය දෛනිකව අධිකරණ භූමියෙන් ඉවත් කිරිම සැපයුම්කරු විසින් සිදුකරන බවට,
- මාසික බදු මුදල් සෑම මසක් අවසන්ව ඊළඟ මස 10 වන දිනට පෙර ආයතන ප්‍රධානියා නම් කරන රජයේ ගිණුමකට සෘජුවම ගෙවා ලදුපත ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කරන බවට,
- මත්පැන්,මත්ද්‍රව්‍ය,දුම්වැටි,බුලත්විට සහ රජය මඟින් විකිණීමට තහනම් කර ඇති ද්‍රව්‍ය හා ඖෂධ වර්ග ආපනශාලාව තුළ නොවිකුණන බවට,
- ආයතන ප්‍රධානියාගේ අනුමැතියකින් තොරව සැපයුම්කරුට වෙනත් පාර්ශවයන්ට ආපනශාලාව තුල ආහාර පිළියෙල කල නොහැකි බවට,

05. ආපනශාලාව සෑම විටම පිරිසිදුව පවත්වාගෙන යායුතු බව සැපයුම්කරුවෙත දැනුම්දිය යුතු අතර ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් ලවා පරික්ෂාවට ලක් කළ යුතුය.

06. ආපන ශාලාවට අවශ්‍ය උපකරණ හා අනෙකුත් යටිතල පහසුකම් තෝරා ගන්නා සැපයුම්කරු විසින් සපයා ගත යුතුවේ. මේ වන විට ආපනශාලාව සඳහා රජයේ වියදමින් මිලදී ගත් භාණ්ඩ/උපකරණ තිබේ නම් ඒවා විධිමත් ලේඛනගත කිරිමක් මඟින් ආපනශාලාවේ ප්‍රයොජනය සඳහා ලබා දිය හැකි අතර ඒ සඳහා ඉහත 02 මගින් දන්වා ඇති ආකාරයට ක්ෂය පිරිවැයක් අය කිරීමට කටයුතු කල යුතුය.

07. ආපන ශාලාවේ සේවය කරන බාහිර පුද්ගලයන්ගෙන් අධිකරණයට හා නඩු භාණ්ඩ වල ආරක්ෂාවට ගැටළුවක් ඇති නොවන ආකාරයට අභ්‍යන්තර ආරක්ෂක ක්‍රමවේදයන් ස්ථාපිත කර ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීමකි.

08. ආපනශාලාව පවත්වා ගෙන යාම යම් සුභ සාධක සංගමයක් මඟින් සිදු කරන්නේ නම්, එම සුභ සාධක සංගමය සම්බන්ධයෙන් ද මෙම චක්‍රලේඛයේ සියළු විධිවිධාන අදාළ වේ.

09. යම් සුභ සාධක සංගමයක් විසින් ආපන ශාලාව පවත්වා ගෙන යාමේදී අධිකරණ වල සේවයේ නියුතු නිලධාරීන් / සේවකයන් ආපන ශාලාවේ කටයුතු වල යෙදීම සිදු නොකල යුතුය.

මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2023.10.10 දින සිට ක්‍රියාත්මක වේ.

ලේකම්
අධිකරණ ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම්,අධිකරණ සේවා කොමිෂන් සභාව
2. ප්‍රධාන මූල්‍ය නිලධාරි - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය